PARL
People's Alliance for Right to Land

**The People's Alliance For Right To Land**
102/3, Barnes Place, Colombo 7, Sri Lanka
Parlsl.com
+94 77 232 3277

# දිත්වා සුළි කුණාටුවෙන් පසු මලයහ ප්‍රජාවගේ ඉඩම් අයිතිය සහ නිවාස පිළිබඳ ඉඩම් අයිතිය සඳහා වූ ජනතා සන්ධානයේ ප්‍රකාශය.

ශ්‍රී ලංකාව පුරා පුළුල්ව පැතිරුණු, බරපතල විනාශයක් ඇති කළ දිත්වා සුළි කුණාටුව මෙරට සිටින මලයහ ප්‍රජාව කෙරෙහි සාපේක්ෂ ලෙස වඩාත් දැඩි බලපෑමක් ඇති කළේ ය.

වසර දෙසියයකට (200) අධික කාලයක් පුරා මලයහ ප්‍රජාව දැඩි අහිමිකිරීම් වලට සහ ආන්තිකකරණයට ලක්වූ තත්ත්වයන් විඳදරා ගනිමින් වතු ඉඩම්වල ස්වකීය ජීවිතය පවත්වාගෙන ගොස් ඇත. පරම්පරා ගණනාවක් තිස්සේ ඉඩම් සහ නිවාස සඳහා තමන්ට ඇති අයිතිවාසිකම් අහිමිවූ මෙම ප්‍රජාව, ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැති, සනීපාරක්ෂාව දුර්වල වූ, සාමාන්‍ය පොදු සේවා වලින් වෙන්ව හුදකලා වූ, අබලන්ව ඇති ලයින් කාමරවලට සීමාවී ජීවත්ව ඇති අතර, දීර්ඝ කාලයක් තිස්සේ ඔවුන්ට ආරක්ෂිත නිවාස සහ ඉඩම් හිමිකාරිත්වයේ ගරුත්වය ද අහිමි කරනු ලැබ ඇත. දිත්වා සුළි කුණාටුව හේතුවෙන් මෑතක දී සිදු වූ විනාශය ඔවුන්ගේ ජීවන තත්ත්වයන්හි ඇති දුර්වලබව නිරාවරණය කළා පමණක් නොව, ඔවුන්ගේ ආන්තිකකරණය තවත් තීව්‍ර කර, විනාශකාරී මට්ටම් දක්වා උග්‍ර කර ඇත.

සුළිකුණාටුවෙන් බලපෑමට ලක්වූවන්ගේ පීඩාවන් තවදුරටත් සංකීර්ණ කරමින් මලයහ ප්‍රජාවට ම විශේෂිත වූ බරපතල ගැටළු ඉස්මතු වී තිබේ. මෙම ප්‍රජාවෙහි පීඩාවට පත්වූවන් අතර බෙදා දීම සඳහා ලබා දෙන ලද පරිත්‍යාග වතු සමාගම් විසින් ප්‍රතික්ෂේප කරන ලද බවට, නැත හොත් ඒවා බෙදා දීමට බාධා කරන ලද බවට වාර්තා පළ වූ අතර, එය ජීවත්වීම සඳහා අත්‍යවශ්‍ය සහනාධාර ලබා දීමේ මාර්ග නවතා දැමීමක් වේ. වතුකරයේ දුරස්ථ ප්‍රදේශවල සැඟවී තිබෙන ඔවුන්ගේ ජනාවාස භූගෝලීය වශයෙන් හුදකලාව පැවතීම ඔවුන්ට විශේෂිත සහ දැඩි අභියෝග නිර්මාණය කර ඇත: සහනාධාර සැපයුම් සහ ආහාර සලාක මෙම ප්‍රජාවන් වෙත ළඟා වීමට දිගු කාලයක් ගත වී ඇති බැවින්, ඔවුන්ට බොහෝ කාලයක් ප්‍රමාණවත් ආහාර, ජලය හෝ වෛද්‍ය ආධාර නොමැතිව ජීවත් වීමට සිදු වී ඇත. තමන්ට රැකියාව කිරීමට ඇති හැකියාව මත තම ජීවනෝපාය රඳා පවතින දෛනික වැටුප් ලබන පුද්ගලයන්ට මාර්ග පද්ධතිය විනාශ වීම හේතුවෙන් සති ගණනාවක් තිස්සේ ජීවනෝපායක් උපයා ගැනීමට නොහැකි වී තිබේ.

ඇතැම් පවුල් විනාශ වූ පේළි නිවාස වලින් සහ අධි අවදානම් ප්‍රදේශ වලින් ඉවත් කර, කඳවුරු සහ නවාතැන් වෙත රැගෙන ගොස් ඇති නමුත්, ඔවුන්ට ජීවත්වීමට සිදුවී තිබෙන තත්ත්වයන් කිසිසේත් සතුටුදායක නොවේ. තාවකාලික නවාතැන් ලෙස භාවිතා කිරීම සඳහා පල්ලි, කෝවිල්, පන්සල් හෝ පාසල් වැනි විශාල පොදු අවකාශයන් නොමැති වතු ප්‍රදේශවල, කඳුකර භූමියේ පිහිටි සීතල, තද පොළොව මත, ප්ලාස්ටික් තහඩු වලින් ඉදිකරන ලද තාවකාලික පැල්පත්වල ජීවත් වීමට පවුල් වලට බල කරනු ලැබ ඇත. සුළි කුණාටුවෙන් පසු මාසයකට අධික කාලයක් ගතවී ඇතත්, තවමත් බොහෝ පවුල් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ ආරක්ෂක තක්සේරු කිරීම් සිදුකරන තෙක් බලා සිටිති. අවශ්‍ය කාලයේ දී එම තක්සේරු කිරීම් සිදු නොවීම නිසා සහ ප්‍රායෝගික විකල්ප නොමැතිවීම නිසා, ආසන්න නායයෑම් අවදානම් සහිත ප්‍රදේශවල පිහිටා ඇති, ඉරිතැලීම් දක්නට ලැබෙන, ගොඩනැගිලි ව්‍යුහය අවදානම් සහගත වූ පේළි නිවාස වෙත නැවත යාමට ඇතැම් පවුල්වලට සිදුවී ඇත.
ස්ථිරව ම නැවත පදිංචි කළ යුතු වන පවුල් සඳහා විකල්ප ආරක්ෂිත නිවාස සහ ඉඩම් ලබා දෙන තෙක් රජය එම පවුල් වලට රුපියල් 25,000 ක නිවාස කුලී සහනාධාරයක් ලබා දෙන බවට ප්‍රකාශයට පත් කර ඇතත්, එම සහනාධාරය ප්‍රමාණවත් නොවන සහ ප්‍රායෝගික නොවන බව පැහැදිලි වී ඇත. එවැනි ආරක්ෂිත වූ නිවාස හිඟ මෙම ප්‍රදේශවල කුලී නිවාස හිමියන් ඔවුන්ගේ කුලී නිවාස මිල ඉහළ නංවමින්, රුපියල් 100,000 ක් තරම් අධික මූලික මුදලක් ඉල්ලා සිටිමින් මෙම අර්බුද අවස්ථාවෙන් වාසි සලසා ගැනීමට කටයුතු කරන නිසා පීඩාවට පත් පවුල් වලට එවැනි අධික වියදමක් දරා ගැනීමට නොහැකිවී තිබේ. විශේෂයෙන් ම වතු ප්‍රදේශවල බලපෑමට ලක් වූ පවුල් වලින් බහුතරයකට, නිවාස කුලියට ගැනීම හුදෙක් ප්‍රායෝගික විකල්පයක් නොවේ. මලයහ ප්‍රජාවගේ විශේෂිත භාෂාමය, සංස්කෘතික සහ සැපයුම් අවශ්‍යතා ක්‍රමානුකූලව නොසලකා හරිනු ලබමින් තිබේ. පවුල් හදිසියේ ඉවත් කිරීම්, සහන සැපයීම් සහ

නැවත ස්ථානගත කිරීම් ආදියට සම්බන්ධ අතිශය වැදගත් තොරතුරු සහ ලියවිලි මෙම ප්‍රජාවගේ ප්‍රධානම භාෂාව වන දෙමළ භාෂාවෙන් සපයා නොදෙන බැවින් එය ඔවුන්ට උපකාර කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාවලීන් ගෙන් ඔවුන්ව තවදුරටත් කොන් කර, දුරස් කර තැබීමක් වේ.

මෙය හුදෙක් ස්වාභාවික විපතක් පමණක් ම නොවේ; එය දශක ගණනාවක් තිස්සේ පද්ධතිමය ලෙස නොසලකා හැරීම, සූරාකෑමට ලක් කිරීම සහ මූලික අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කිරීම තුළ මුල් බැසගත් අර්බුදයක් ද වේ. මලයහ ප්‍රජාව අඛණ්ඩව මුහුණ දෙන ව්‍යුහාත්මක වෙනස්කොට සැලකීම් දිත්වා සුළි කුණාටුව විසින් හෙළිදරව් කර ඇති අතර, තාවකාලික විසඳුම්, හිස් පොරොන්දු සහ විවිධ වූ සහන ප්‍රයත්නයන් ප්‍රමාණවත් නොවන බව ද පැහැදිලි කර ඇත.

සිවිල් සමාජ සංවිධානවල, ක්‍රියාකාරීන්ගේ, නීතිඥයන්ගේ සහ ප්‍රජාවගේ සාමූහිකයක් වන, ඉඩම් අයිතිය සඳහා වන ජනතා සන්ධානය ලෙස අපි මලයහ ප්‍රජාවට පූර්ණ අයිතිය සහිත ඉඩම් සහ නිවාස සපයා දෙන ඉල්ලා සිටින්නෙමු. වතු ප්‍රදේශවල ජනතාවට තම ජීවිත නැවත ගොඩනගා ගත හැකි, තම පවුල් පෝෂණය කළ හැකි සහ අවතැන් වීමේ හෝ නෙරපා හරිනු ලැබීමේ නිරන්තර බියකින් තොරව ජීවත් විය හැකි, තමන්ට ම අයත් ඉඩම්වල ආරක්ෂිත, ස්ථිර නිවාස ලැබිය යුතු ය. ඔවුන්ට ස්වාභාවික විපත් වලට ඔරොත්තු දිය හැකි යටිතල පහසුකම්, තමන්ගේ භාෂාවෙන් සේවා වෙත ප්‍රවේශය වීමේ හැකියාව සහ රටේ සමාන පුරවැසියන් ලෙස පිළිගැනීම හිමි විය යුතු ය.

මලයහ ප්‍රජාව වෙනුවෙන් වන අපගේ දිගුකාලීන ඉල්ලීම් වලට පහත සඳහන් ඉල්ලීම් ඇතුළත් වේ: පළමුව, ඉඩම් සඳහා සුරක්ෂිත හිමිකමක්; සහ දෙවනුව, වතු සමාගම්වල පාලනයෙන් පරිබාහිරව පිහිටි සහ රජයේ පාලනය යටතේ පවතින නව ගම්මානයක් ලෙස පිළිගනු ලබන, සුරක්ෂිත ඉඩම් හිමිකමක් සහිත වෙනම ම නිවාස.

දිත්වා සුළි කුණාටුව හේතුවෙන් ඇතිවූ අර්බුදයට ප්‍රතිචාර වශයෙන් අපි පහත සඳහන් ඉල්ලීම් ද ඉදිරිපත් කරන්නෙමු:

- සුළි කුණාටුවෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීමේ දී, විශේෂයෙන් ම වන්දි සහ සහනාධාර බෙදා හැරීමේ දී, වතු ප්‍රදේශවල ප්‍රජාවන් සහ වතු ප්‍රදේශවල නොවන ප්‍රජාවන් ලෙස කිසිදු වෙනස්කොට සැලකීමක් සිදු නොකළ යුතු ය.

- සුදුසු විකල්ප ඉඩම් තෝරා ගැනීමේ දී රජය විසින් බලපෑමට ලක් වූ ප්‍රජාව, රාජ්‍ය ආයතන, සිවිල් සමාජය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සහ වතු සමාගම් සම්බන්ධ කර ගනිමින් සහභාගීත්ව උපදේශන ක්‍රියාවලියක් අනුගමනය කළ යුතු ය. මලයහ ප්‍රජාව තවදුරටත් අනාරක්ෂිත නිවාස තත්වයන්ට ඇද දමන මහල් නිවාස වැනි පෙර අසාර්ථක ආකෘති විකල්ප නිවාස ලෙස මලයහ ප්‍රජාව මත පැටවීම වළක්වන බව එම ක්‍රියාවලිය මගින් සහතික කළ යුතු ය.

මලයහ ප්‍රජාවට ඉඩම් අයිතිය සහ සුදුසු නිවාස ලබා දීම සඳහා රජය, වතු සමාගම් සහ අදාළ සියලු ම බලධාරීන් වහාම ක්‍රියා කළ යුතු ය. එයට අඩු මට්ටමේ ඕනෑම තත්ත්වයක් සියවස් දෙකක් තිස්සේ ඔවුන්ගේ පැවැත්ම නිර්වචනය කර ඇති අසාධාරණයෙහි ම අඛණ්ඩ පැවැත්මක් වේ.